මෙම ලිපියේ අරමුණ දැනට ලංකාවේත්, ලෝකයේත්, සමාජවාදී, රැඩිකල්වාදී සහ ජාතිකවාදී දේශපාලන කතිකාවල බහුලව යෙදෙන සංකල්පයක් වන ‘නව-ලිබරල්වාදය’ යන්න හඳුනාගැනීමයි.

‘නව-ලිබරල්වාදය’ යනු එහි හිමිකරුවන් හෝ නියෝජිතයන් හෝ භාවිත නොකරන වචනයකි. නිදසුනක් ලෙස ඇමෙරිකාවේ ආණ්ඩුව, ලෝක බැංකුව, වෝල් ස්ට්‍රීට් ජර්නල් නම් පුවත්පත තමන් නව-ලිබරල්වාදීන් ලෙස හඳුන්වාගන්නේ නැත. නව-ලිබරල්වාදීන් ලෙස ඔවුන් හඳුන්වන්නේ එහි වාමාංශික, රැඩිකල් සහ ජාතිකවාදී විවේචකයන් විසින්ය. එම විවේචකයන් ‘නව-ලිබරල්’ යන සංකල්පය අර්ථ හතරකින් භාවිත කරන බව පෙනේ. ඒවා නම්,

1. ලෝක ධනවාදයේ වර්තමාන අවධිය හැඳින්වීමට,

2. එම අවධිය සමග සම්බන්ධ දේශපාලන මතවාදය හැඳින්වීමට.

3. ලෝක ධනවාදයේ නව අවධියට ගැළපෙන සහ නව ලිබරල්වාදී මතවාදයට අනුව සකස් කරන ලද ප්‍රතිපත්ති හැඳින්වීමට.

4. එම ප්‍රතිපත්ති නිසා ලෝකයේත්, එක් එක් රටවලත් සිදුවන ආර්ථික, දේශපාලන සහ සමාජ ප්‍රතිසංස්කරණ සහ පරිවර්තන හැඳින්වීමට.

උගතුන් අතරද ලෝක ධනවාදයේ වර්තමාන අවධිය හැඳින්වීමට ‘නව-ලිබරල්’ යන සංකල්පය සාමාන්‍යයෙන් භාවිත කරන්නේ වාමාංශික ශාස්ත්‍රාලීන්ය. ඔවුන්ගේ විග්‍රහය නම්, 1970 ගණන්වල ලෝක මූල්‍ය අර්බුදයෙන් පසුව, ධනවාදය මුහුණ දුන් ලාභ ලැබීමේ සහ ප්‍රාග්ධන සමුච්චීකරණයේ අර්බුදයට මුහුණ දීමට, ලෝක ධනවාදය තවදුරටත් ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමට අවශ්‍ය වූ බවයි. ධනවාදය අලුතින්, ලෝක මට්ටමෙන් ව්‍යාප්ත වීමේ මෙම ක්‍රියාවලිය 1980 ගණන්වල මැදදී ආරම්භ වූ අතර, එයට නායකත්වය දෙන ලද්දේ මූල්‍ය ප්‍රාග්ධනය සහ ජාත්‍යන්තර මූල්‍ය සහ ගෝලීය වාණිජ කළමනාකරණ ආයතන විසිනි. මේ අනුව, නව-ලිබරල්වාදයේ යුගය, ලෝක ධනවාදී ක්‍රමය තුළට මූල්‍ය ප්‍රාග්ධනයේ ආධිපත්‍යයේද යුගයයි. එය එම යුගයේ ඇති විශේෂ ලක්ෂණයද වෙයි.

# ආර්ථික ප්‍රතිව්‍යුහගත කිරීම

මූල්‍ය ප්‍රාග්ධනයට ව්‍යාප්ත විය හැකි ආකාරයට, ධනවාදී ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රධාන අරමුණ විය. ඒ සඳහා ඒ වන විට පැවති කේනීසියානු සහ සුභසාධනවාදී ධනවාදයේ ප්‍රතිපත්ති රාමුව අවසන් කරමින්, ජාතික ආර්ථිකයන් ප්‍රතිව්‍යුහගත කළ යුතු විය. ලංකාවේද 1980 ගණන්වල මැදදී ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ ව්‍යුහාත්මක ගැළපුම් ප්‍රතිසංස්කරණවලින් සිදුවූයේ, ජාතික ආර්ථික 'වෙළෙඳපොළ කේන්ද්‍රීය' සහ 'රාජ්‍ය නිර්බාධවාදී' සහ 'නිදහස්' ආර්ථික බවට පත්කිරීමයි. ලංකාවේ මෙම ක්‍රියාවලිය ලෝක නව-ලිබරල්වාදය පැමිණෙන්නට අවුරුදු දහයකට පෙර, එනම් 1978දී ආරම්භ කර තිබුණ නිසා, 1988න් පසුව ජනාධිපති ප්‍රේමදාස මහතාගේ කාලයේ ක්‍රියාත්මක කිරීමට ආරම්භ වූ ව්‍යුහාත්මක ගැළපීමේ ප්‍රතිපත්තිවලින් සිදුවූයේ, 1978 ආරම්භ වූ ආර්ථික නිදහස්කරණ ක්‍රියාවලිය තවත් ඉදිරියට ගෙනයාමයි. මෙම නව ආර්ථික ප්‍රතිපත්ති රාමුවේ පිතෘවරුන් වූයේ ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයි. මෙම ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂා කෙරුණේ, ලංකාවේ මෙන්ම අනෙක් රටවලද, ධනවාදයේ වැඩිදුර ව්‍යාප්තියට තිබූ ව්‍යුහාත්මක සහ ප්‍රතිපත්තිමය බාධක ඉවත් කිරීමයි. වෙළෙඳපොළ ආණ්ඩුවේ පාලනයෙන් නිදහස් කිරීම, ආයාත-නිර්යාත සහ මූල්‍ය වෙළෙඳපොළ ආණ්ඩුවේ පාලනයෙන් නිදහස් කිරීම, අය-වැය පරතරය පියවීම සඳහා රජයේ වියදම් කපාහැරීම, රාජ්‍යය නිර්-සුභසාධනවාදී කිරීම, මුදල් ඒකකය අවප්‍රමාණ කිරීම සහ මුදල් ඒකකයේ වටිනාකම තීරණය කිරීම වෙළෙඳපොළට බාරදීම, විදේශ ආයෝජන සහ නිර්යාත කේන්ද්‍රකොට ගත් ආර්ථික වර්ධන මූලෝපායක් ක්‍රියාත්මක කිරීම මෙම නව-ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රධාන අංග විය.

ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ දෙවන වරට දියත් කරන ලද මෙම නව-ලිබරල්කරණ ප්‍රතිපත්තිය, 1994 සිට පොදු පෙරමුණු ආණ්ඩුව විසින් තවදුරටත් ඉදිරියට ගෙන යන ලදි. එම සභාගය ශ්‍රීලනිපය සහ වාමාංශික පක්ෂ අතර සන්ධානයක් වීම අප අමතක නොකළ යුතු කරුණකි. ලෝකයේ සමාජවාදී ක්‍රමය බිඳවැටී, රුසියාව මෙන්ම චීනයද පශ්චාත්-සමාජවාදී ධනවාදී ක්‍රම දෙකක් කරා පරිවර්තනය වීම ආරම්භ වූ එම කාලයේ, නව-ලිබරල් පරිවර්තනයට එරෙහි වීමට තරම් ශක්තියක් වාමාංශික ව්‍යාපාරවලට තිබුණේ නැත. 'මානුෂික මුහුණුවරක් සහිත ධනවාදය' යන උද්යෝග පාඨය යටතේ, ලංකාවේ සිදුවූ නව ලිබරල් පරිවර්තනය සාධාරණය කරන ලද්දේ මෙම පසුබිම තුළය.

# නව-ලිබරල්වාදී දේශපාලන මතවාදය

වර්තමාන නව ලිබරල්වාදී දේශපාලන මතවාදයේ ප්‍රධාන ලක්ෂණයක් නම්, එහි අලුත් විශාල අදහසක් නොවීමයි. එය 17වැනි සියවසේ මතුවූ, සහ කේනීසියානු සුභසාධනවාදයට විරුද්ධව 1940 ගණන් සහ 1950 ගණන්වල යළි මතුවූ නිදහස් වෙළෙඳපොළ ආර්ථික මතවාදය, යළි ඉදිරිපත් කිරීමකි. රාජ්‍ය නිර්බාධවාදී ලිබරල් දේශපාලන න්‍යායේ ප්‍රධාන චින්තකයා 17වැනි සියවසේ සිටි ඉංග්‍රීසි ජාතික ජෝන් ලොක්ය. ඇඩම් ස්මිත් එහි ප්‍රධාන සම්භාව්‍ය න්‍යායවේදියෙක් විය. 1930 ගණන්වල ලෝක ආර්ථික අවපාතයට ප්‍රතිකාර වශයෙන්, කේන්ස් යෝජනා කළ සහ ධනවාදී රටවල් පිළිගෙන ක්‍රියාත්මක කළ රාජ්‍ය මැදිහත්වීම්වාදී සහ සුභසාධනවාදී ධනවාදයට එරෙහිව, රාජ්‍ය නිර්බාධවාදී ආර්ථික සහ දේශපාලන ධර්මය

කරා නැවත යාම යෝජනා කළේ ෆ්‍රෙඩ්රික් වොන් හයෙක් සහ මිල්ටන් ෆ්‍රීඩ්මන් යන ආර්ථික විද්‍යාඥයන් දෙදෙනාය.

වොන් හයෙක් (VON HAYEK) 1943දී පළකළ Capitalism and Freedom(ධනවාදය සහ නිදහස) යන කෘති දෙක රාජ්‍ය නිර්බාධවාදී ලිබරල් ආර්ථික ධර්මයත්, දේශපාලන දර්ශනයත් පුනර්ජීවනය කිරීම අරමුණු කොටගෙන විසිවැනි සියවසේ ලියැවුණ ප්‍රමුඛ ග්‍රන්ථ දෙකද වේ. 1980 ගණන්වල අග සිට ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලෝකයට නිර්දේශ කළ ආර්ථික, සමාජ සහ දේශපාලන ප්‍රතිසංස්කරණ වට්ටෝරුව මූලික වශයෙන් ඉහත කී ආර්ථික විද්‍යාඥයන් දෙදෙනාගේ අදහස් ඔවුන්ගේ වචනවලින්ම යළි ප්‍රකාශ කිරීමක් විය.

# බාධා ඉවත් කිරීම

නව-ලිබරල් ආර්ථික ධර්මයේ අරමුණ, මූල්‍ය ප්‍රාග්ධනයේ නායකත්වයෙන් ධනවාදය ජාතික රාජ්‍ය ඇතුළතත්, ලෝකය පුරාත් ශීඝ්‍රයෙන් ව්‍යාප්ත කිරීම නම්, නව-ලිබරල් දේශපාලන ධර්මයේ අරමුණ වූයේ, ඒ සඳහා තිබෙන දේශපාලන සහ සමාජීය බාධාවන් ඉවත්කිරීමයි. ඒ සඳහා රාජ්‍යය, ආණ්ඩුක්‍රමය, රාජ්‍යය සහ පුරවැසියා අතර සම්බන්ධය, රාජ්‍යයේ ආර්ථික කාර්යය යන මේවා, සුහසාධන ධනවාදය යටතේ තිබි තත්වයන්ගෙන් සම්පූර්ණයෙන් වෙනස් කිරීමයි. දේශපාලන සහ සමාජ ව්‍යුහයන් ප්‍රතිව්‍යුහගත කිරීමයි. මෙම ව්‍යාපෘතියේ දේශපාලන ක්‍රියාමාර්ගයේ ප්‍රධාන අංගය වූයේ 'නිදහස් වෙළෙඳපොළ' තව තවත් නිදහස් කිරීම සහ ඒ සඳහා වෙළෙඳපොළේ 'නිදහස් ක්‍රියාකාරිත්වයට' ඉඩ සපයන ලෙස ආර්ථික සහ සමාජ ක්ෂෙත්‍රවල රාජ්‍යය/ආණ්ඩුව ඉටු කළ කාර්යභාරය දැඩි ලෙස සීමා කිරීමයි.

ලංකාවේ 1978 ආර්ථික ලිබරල්කරණය ආරම්භ වීමේ සිට අද දක්වා ක්‍රියාත්මක වන්නේ මෙම ආර්ථික සහ දේශපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ගයි. එම ක්‍රියාවලියට සීමා පැනවීමට ශ්‍රීලනිපය නායකත්වය දුන් ආණ්ඩු සහ වර්තමාන පොදු ජන පෙරමුණු ආණ්ඩුව නොයෙක් උත්සාහ ගෙන තිබුණද, ඒවා අසාර්ථක උත්සාහ වී තිබේ. එය වෙනම සාකච්ඡා කළ යුතු මාතෘකාවකි.

# නව ලිබරල්වාදය සහ ප්‍රජාතන්ත්‍රවාදය

අප රටේත්, වර්තමාන ලෝකයේත්, නව-ලිබරල්වාදයේ දේශපාලනය පිළිබඳව සිදුවන සාකච්ඡාවේ එක් උප තේමාවක් වන්නේ, නව ලිබරල්වාදී පරිවර්තනය සහ ප්‍රජාතන්ත්‍රවාදය අතර ඇති සම්බන්ධයයි. එය අප කෙටියෙන් හෝ විමසා බැලිය යුතු කරුණකි.

නව ලිබරල්වාදයේ දේශපාලන ධර්මය, ජෝන් ලොක් සහ ඇඩම් ස්මිත් වැනි සම්භාව්‍ය ලිබරල් න්‍යායවේදීන්ගේත්, ෆ්‍රෙඩ්රික් වොන් හයෙක් සහ මිල්ටන් ෆ්‍රීඩ්මන් යන නව ලිබරල්වාදී න්‍යායවේදීන්ගේත් ඉගැන්වීම්වල සංකලනයකි. එහි මූලික උපකල්පන කිහිපයක් තිබේ. ඒවා නම්,

* ආර්ථික වර්ධනයේ මූලික ගමන්මග වන්නේ ධනවාදී ක්‍රමයේ අනවරත සහ නිරන්තර ව්‍යාප්තියයි.

* ආර්ථික වර්ධනය සහ ආර්ථික සමෘද්ධිය සහතික කිරීම සඳහා ධනවාදයේ නිරන්තර ව්‍යාප්තියේ යාන්ත්‍රණය වන්නේ නිර්බාධිත, නිදහස් වෙළෙඳපොළයි. නිදහස් වෙළෙඳපොළ අවශ්‍ය වන්නේ, ආර්ථික

තරගය සහ ආර්ථික ක්‍රියාවලියට සහභාගිවීමට සෑම පුද්ගලයකුටම අවකාශ සහතික කිරීමටය.

* නිදහස් වෙළෙඳපොළ, ආර්ථික තරගය සහ ආර්ථික ක්‍රියාවලියට සහභාගි වීමේ නිදහස සහතික කිරීමට නම්, රාජ්‍යය/ආණ්ඩුව ආර්ථික ක්‍රියාවලියට බාධාකාරීව මැදිහත් නොවිය යුතුය. නිදහස් වෙළෙඳපොළ ආර්ථිකය, රාජ්‍ය නිර්බාධිත ආර්ථිකයක් විය යුතුය. ආර්ථික වෘද්ධියේ එන්ජිම වන්නේ වෙළෙඳපොළයි.

* රාජ්‍යයේ/ ආණ්ඩුවේ කාර්යය විය යුත්තේ වෙළෙඳපොළ නිදහසේ ක්‍රියාකිරීමට අවශ්‍ය තත්වයන් සහතික කරනු සඳහා යෝග්‍ය නීති, ආයතන, අධිකරණ ක්‍රම, ආරක්ෂාව ලබාදීම සහ මූලික ආර්ථික ප්‍රතිපත්ති රාමුව තීරණය කිරීමයි. මෙවැනි අවම ආර්ථික කාර්යයකට සීමා වූ ධනවාදී රාජ්‍ය හඳුන්වනු ලබන්නේ 'රෑ මුරකරු රාජ්‍යය' ලෙසිනි.

* එවැනි 'රෑ මුරකරු රාජ්‍යයකට' ඉඩ සැපයීමට ඇති හොඳම දේශපාලන ව්‍යුහය ඇත්තේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේය. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය පුද්ගලික නිදහස, ආර්ථික සහ ව්‍යවසායක නිදහස, වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයේ නිදහස, දේශපාලන තරගය, තම පාලකයන් තෝරාගැනීමට සහ ඉවත්කිරීමට පුරවැසියන්ට ඇති අයිතියේ නිදහස, ආණ්ඩුව මහජන නියෝජනය මත සකස් වීම යන දේශපාලන මූලධර්මවලට ඉඩ ලබාදෙයි.

ඉහත මූලධර්ම වනාහි නව-ලිබරල්වාදී දේශපාලන ධර්මයේ, එනම් දෘෂ්ටිවාදයේ ප්‍රධාන අංගයි. ලංකාවේ එක්සත් ජාතික පක්ෂය, විශේෂයෙන් එහි නායකත්වය, මෙම දෘෂ්ටිවාදය වැළඳගත්, ඒ මත සිය දේශපාලන ප්‍රතිපත්ති සකස් කර ඇති පක්ෂයකි. ශ්‍රීලනිපය සහ පොදු ජන පෙරමුණ මෙම නව ලිබරල්වාදී දේශපාලන ධර්මය සම්පූර්ණයෙන් වැළඳගෙන නැත. 'ආර්ථිකයට රාජ්‍යය මැදිහත් නොවීම', 'අවම රාජ්‍යය' සහ 'පුද්ගලික නිදහස' යන මූලධර්ම තුන එහි විවේචනයට සහ මෑතදී පෙනෙන පරිදි ප්‍රතික්ෂේප කරනු ලැබීමට පත්වී තිබේ. ඇමෙරිකාව, යුරෝපය මෙන්ම ලංකාවද ඇතුළු බටහිර නොවන ලෝකයේද වාමාංශික සහ රැඩිකල් කණ්ඩායම්, නව-ලිබරල්වාදී ආර්ථික සහ දේශපාලන ප්‍රතිසංස්කරණ දැඩි විවේචනයට ලක්කරති. මෙම විවාද සහ මතවාදී ගැටුම් අතරට මැදිවී තිබෙන තවත් ප්‍රශ්නයක් තිබේ. එය නම්, ලංකාව වැනි බටහිර නොවන, සංවර්ධනය වන රටවල ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ගැටලුවයි. එය අපගේ වැනි රටවල පුරවැසියන්ගේ දේශපාලන ජීවිතයේ ඇති හදිසි සහ අතිමූලික අභියෝගයකි. අපගේ වැනි සමාජ මුහුණ දී තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ගැටලුව, නව-ලිබරල්වාදය පිළිබඳ විවාදයෙන් සාපේක්ෂ වශයෙන් වෙන් කර ගත යුතුය යන්න, අප රටේ දේශපාලන යථාර්ථය විසින් අපට යෝජනා කෙරෙන අදහසකි. මේ කරුණ පිළිබඳව ඉදිරියේදී සාකච්ඡා කළ හැකිය. ■